# වාසනාවන්ත අම්මා



තෙනුම් විහස්නා බණ්ඩාර

# වාසනාවන්ත අම්මා

තෙනුම් විහස්නා බණ්ඩාර

# වාසනාවන්ත අම්මා

කර්තෘ : තෙනුමි විහස්නා බණ්ඩාර

4 ශ්‍රේණිය B

මහ/ මහමායා බාලිකා විද්‍යාලය

මහනුවර.

කර්තෘ ප්‍රකාශනයකි.

පළමු මුද්‍රණය : 2023

පිට කවරය : තෙනුමි විහස්නා බණ්ඩාර

ISBN Number : 978-624-206-819-0

# පිදුම

මාගේ මෙම පොත් පිංචය

මගේ ආදරණීය මහමායා මෑණියන්ටද,

සෑම මොහොතකදීම වැරදි නිවැරදි කරමින් මඟ පෙන්වූ

මාගේ ආදරණීය පංතිභාර ගුරුමෑණියන්ටද,

මාගේ දෙමාපියන්ටද,

සහෝදර, සහෝදරියන්ටද

මෙම පොත් පිංචය

ආදරයෙන් යුතුව පුදමි !

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායි පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන් ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාව යි. එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත්කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි. එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුමකරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණයකරමින් " දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි. දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේ ම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමී ව අප පාසල විසින් සංවිධානය කළ "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවා යි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කළමනාකරණ මණ්ඩලය ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන්, සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන්, ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තූතිය මෙමගින් පිරිනමමි.

ශෂිකලා සේනාධීර,
විදුහල්පතිනිය,
මහාමායා බාලිකා විද්‍යාලය මහනුවර.
2023 .11 . 01

වාසනාවන්ත තරුණ කාන්තාවක් විවාහ වී පෙරදිග ගමේ පදිංචියට ගියා. එහිදී ඇයට ලස්සන බබෙක් ලැබුණා.

දවසක් මෙම තරුණ මව රාත්‍රී නින්දෙදි බබාගේ අත්තම්මා අසනීපෙන් සිටින බව සිහිනෙන් දුටුවා.



තරුණ අම්මාට හොඳටම ඇඬුනා. ඇය ඒවලේම ඇගේ මව බැලීම සඳහා යෑමට පිටත් වුණා.

ඇය තමන්ගේ ඇඳුම් යැයි සිතූ දෙයක් ඇඳගෙන, තමන්ගේ බබා යැයි සිතූ යමක් වඩා ගත්තා.

ඉතා ඉක්මණින් හති දමාගෙන දහදිය පෙරාගෙන තම මවගේ නිවස පිහිටි බටහිර ගමට පැමිණියා.



දුකින් සිටි තරුණ අම්මා කෙටි පාරකින් යාම ට සිතා පුහුල් වත්තක් මැදින් ගමන් කරන්නට විය.

ඒහිදි පුහුල් වැලක ඇගේ පය පැටලී තම අත සිටි දරුවා විසි වී වැටුණා.

“කෝ මගේ පුතා” යැයි හඬමින්, ඇය ඉතාම කලබලයෙන් තම සුරතල් දරුවා සොයන්නට විය.

යම් සිනිඳු, රවුම් දෙයක් ඇගේ අතට දැනී ඇය ඒ තම දරුවා යැයි සිතමින් ඉතාම ආදරයෙන් වඩා ගත්තා.

ඇය, බිම වැටී නාඩා සිටින තම බබා වර්ණනා කරන්නට විය.

“ඔබ මාගේ වාසනාව යැයි කීවාය.”

ඉතාම වෙහෙසකාරී ගමනකින් පසු තම මවගේ ගෙදරට පැමිණි ඇය දොරට තට්ටු කරන ගමන් ”අම්මේ ඔබ සනීපෙන් දැයි ඇසුවා.”

”ඇයි ඔබ එහෙම අහන්නේ මම හොඳින් ඉන්නවා” යි මව පිළිතුරු දුන්නා.

“අනික ඇයි ඔබ මේ වෙලාවේ මෙහෙ ආවේ තනියම”. යැයි කලබල වූ මව ඇගෙන් ඇසුවා.

තරුණ මව ඇය සිහිනෙන් දුටු සියළු දේ තම මවට කීවා.

“මම හොඳින් ඉන්නවා දරුවෝ” යැයි මහළු මව සිනහවකින් යුතුව පිළිතුරු දුන්නා.

කෝ මගේ මුණුපුරා මට බලනන් ඕනේ යි ඇත්තම්මා කීවා.

ඇය නැවතත් පුදුම වුණා. ඇගේ දුව කඩාගේ ඔතාගෙන ඇවිත් තිබුණේ පුහුල් ගෙඩියක්.

තම දරුවා පුහුල් වත්තේදී නැති වී ඇති බව වැටහුණු තරුණ මව හඬමින් දරුවා සොයන්න දිව ගියා.

හැම තැනම බඩා සෙව්වා. ඒත් බඩා හමුවුණේ නෑ. මේ වේලාවේ ඇගේ කකුලේ යම් මෘදු දෙයක් වැදුණා. ඇය ඉතාම සතුටින් එය අහුලා වඩා ගත්තා.



පාන්දර එළිය වැටෙනකොට ඈය තම නිවසට පැමිණියා.

ආ..........අර ඇඳ උඩ ලස්සනට නිදා ගෙන ඉන්නේ කව්ද? ඈය පුදුම වුණා. ඒ හිටියේ ඈගේ සුරතල් පුතා, ඈය වඩාගෙන ගොස් ඇත්තේ ඈගේ කොට්ටයයි.



# පසුවදන



නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ, ආර්ථික, පරිවර්තනයන් හේතුකොට ගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. ඒ යටතේ වැඩි ම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන් ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ළඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචානා කරන්නට විය. ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතර ම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනයකරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි. පාසල් මට්ටමින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

**දිවිය දිනන විද්‍යුත් පොතක්** ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඈඳුපිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු . .

මෙයට
සෙනෙවිරත්න මහලේකම්
පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාපක